සැ. යු. - 2009.10.30 දින පළ වූ අංක 1,626 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,627 - 2009 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2009.11.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1796 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1800 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1802 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 නොවැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1795- B 080064— 8,810 (2009/11)

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාර්තමේන්තුව - නුගේගොඩ කොට්ඨාසය

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පොලිස් දෙපාර්තමේන්තුවේ නුගේගොඩ කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම. 2009 නොවැම්බර් මස 12 වැනි දින පැය 0930 මිරිහාන පොලිස් ක්‍රීඩා භූමියේ දී පැවැත්වේ.

2009 නොවැම්බර් මස 11 වැනි දින පැය 1300 සිට 1600 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුල්වන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපතක් ලබාගත යුතුයි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ 2009 නොවැම්බර් මස 12 වැනි දින පැය 1600 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ටී. එම්. ඩබ්. ඩී. තෙන්නකෝන්,
පොලිස් අධිකාරි,
නුගේගොඩ කොට්ඨාසය.

### උපලේඛනය

| අනු. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | වට්ටෝරු පොතේ අංකය |
|---|---|---|---|
| 01. | ටියුබ් ලයිට් කට්ටල | 07 | 08 |
| 02. | ඉබි යතුරු | 01 | 11 |
| 03. | ගිණි නිවන උපකරණ | 01 | 21 |
| 04. | හිරමණ | 04 | 21 |
| 05. | හීටර් | 01 | 21 |
| 06. | ගැල්වනයිස් බාල්දි | 03 | 26 |
| 07. | තාච්චි | 09 | 26 |
| 08. | වතුර පිල්ටර් | 05 | 32 |
| 09. | විදුලි කේතල | 11 | 36 |
| 10. | මල්ටි පොට් | 02 | 36 |
| 11. | ටියුබ් ලයිට් කට්ටල | 08 | 36 |
| 12. | පීඩන ලාම්පු | 06 | 36 |
| 13. | ඇල්මිණියම් කේතල | 03 | 41 |
| 14. | පාපැදි අගුල් | 02 | 41 |
| 15. | පුටු කැබලි යකඩ බට | 42 | 41 |
| 16. | මේස විදුලි පංකා | 16 | 41 |
| 17. | යුගල ඇඳන් තට්ටු | 03 | 09 |
| 18. | තනි ඇඳන් තට්ටු | 10 | 09 |
| 19. | පා පැදි | 43 | 18 |
| 20. | වතුර බොයිලේරු | 03 | 18 |
| 21. | දුරකථන හුවමාරු පද්ධති | 01 | 18 |
| 22. | ජෙනරේටර් | 01 | 21 |
| 23. | ෆැක්ස් මැෂින් | 05 | 21 |
| 24. | ගෑස් ලිප් | 02 | 32 |
| 25. | ඡායා පිටපත් යන්ත්‍ර | 01 | 32 |
| 26. | ටී. වී. මැෂින් | 01 | 32 |
| 27. | රූපවාහිනී යන්ත්‍ර අඟල් 21 | 05 | 32 |
| 28. | රූපවාහිනී යන්ත්‍ර අඟල් 14 | 01 | 32 |
| 29. | රූපවාහිනී යන්ත්‍ර අඟල් 12 | 03 | 32 |
| 30. | යතුරුලියන ඉංග්‍රීසි | 27 | 36 |
| 31. | යතුරුලියන සිංහල | 32 | 36 |
| 32. | සීලිං විදුලි පංකා | 34 | 36 |
| 33. | ඇලුමිනියම් ජෝගු | 02 | 43 |
| 34. | ගුවන් විදුලි යන්ත්‍ර | 03 | 43 |
| 35. | ඇලුමිනියම් තේ පෝච්චි | 03 | 43 |
| 36. | කල්දේරම් අඟල් 34 | 02 | 45 |
| 37. | කල්දේරම් අඟල් 32 | 05 | 45 |
| 38. | කල්දේරම් අඟල් 24 | 07 | 45 |
| 39. | කල්දේරම් අඟල් 18 | 05 | 45 |
| 40. | කල්දේරම් අඟල් 14 | 04 | 45 |
| 41. | කල්දේරම් අඟල් 12 | 04 | 45 |
| 42. | කල්දේරම් අඟල් 20 | 02 | 45 |
| 43. | කොරස් | 01 | 48 |
| 44. | අනුපිටපත් යන්ත්‍ර | 02 | 51 |
| 45. | ගණක යන්ත්‍ර | 18 | 51 |
| 46. | වානේ කැබිනට් | 03 | 51 |
| 47. | ලන්තෑරුම් | 01 | 53 |
| 48. | විදුලි පන්දම් | 03 | 53 |
| 49. | ඉබි යතුරු | 02 | 53 |
| 50. | මල් කතුරු | 02 | 53 |
| 51. | ප්ලෑෂ් ලියිට් | 01 | 55 |
| 52. | ප්‍රින්ටර් | 01 | 55 |
| 53. | වතුර බොයිලේරු | 01 | 57 |
| 54. | වානේ අල්මාරි | 01 | 57 |
| 55. | සිටුවන විදුලි පංකා | 04 | 41 |
| 56. | කුෂන් පුටු කැබලි යකඩ බට | 04 | 41 |

11-78

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

2009.11.08 දින පෙ.ව. 9.00ට පහත සඳහන් අබිලි භාණ්ඩ බදුල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාස බඩු ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පවත්වන දිනයේ පෙ.ව. 8.00 සිට 9.00 දක්වා මෙම භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය. ගැනුම්කරුවන් විසින් එවෙලේම සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා තමන් මිලට ගත් භාණ්ඩ වහාම එම ස්ථානයත් ඉවත් කර ගත යුතුය. තවද, මෙහි සඳහන් භාණ්ඩ වෙන්දේසියේ නොවිකුණා ඉවත් කිරීමේ බලය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, බදුල්ල සතුය.

ඒ. සී. විජේසූරිය,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
බදුල්ල.

| | *භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | විදුලි කේතල | 02 |
| 02. | ඇඳි සහිත ලී පුටු | 05 |
| 03. | විධායක පුටු | 02 |
| 04. | ලී කැබිනට් | 01 |
| 05. | ඇන්ටනා | 01 |
| 06. | කාර්යාල ට්‍රේ | 06 |
| 07. | වානේ ලිපි ගොණු කබඩ් | 01 |
| 08. | එකතු කිරීමේ යන්ත්‍ර | 01 |
| 09. | පිහිටා තල | 02 |
| 10. | සාස්පාන් | 08 |
| 11. | අබලන් පාපැදි | 06 |
| 12. | ෆැක්ස්යන්ත්‍ර | 01 |
| 13. | ඇලුමිනියම් සෙට් | 01 |
| 14. | පාපැදි | 02 |
| 15. | ෆොටෝකොපි මැෂින් | 01 |
| 16. | රූපවාහිනී යන්ත්‍ර | 03 |
| 17. | මොනිටර් | 01 |
| 18. | සිවිලින් විදුලි පංකා | 07 |
| 19. | වයර් කිලෝ | 03 |
| 20. | ටියුබ් ලයිට් කට්ටල් ආදිය | 18 |

11-97

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මාලිගාකන්ද

මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2009.12.19 වැනි දින පෙ. ව. 9.30 ට අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත මෙදින පෙ. ව. 8.30 සිට 9.30 වන තෙක් භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

ජී. එල්. ප්‍රියන්ත,
මහෙස්ත්‍රාත් - මාලිගාකන්ද.

2009 ඔක්තෝබර් මස 19 වැනි දින,
මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 97106 | Hand mixer එකයි |
| 02. | 97116 | Hair Drier එකයි |
| 03. | 97089 | ජංගම දුරකථන චාජර් එකක් |
| 04. | 67041 | Diana Hair Drier එකක් |
| 05. | 10752 | ඔප්ටිකල් මවුස් එකක් |
| 06. | 11172 | රන් කිරුම් තැටි තරාදියක් |
| 07. | 97091 | Kemei රැවුල බාන උපකරණය |
| 08. | 10744 | Power Supply එකක් |
| 09. | 97097 | Sonica කුඩා රේඩියෝව |
| 10. | 11173 | රන් කිරුම් ඉලෙක්ට්‍රෝනික් තරාදිය |
| 11. | 10751 | Xinama ඇඩෝප්ටර් එකක් |
| 12. | 11170 | දුණු තරාදියේ මුහුණත |
| 13. | 9250 | නොකියා ජංගම දුරකථන බැටරිය |
| 14. | 91439 | Toshika කුඩා රේඩියෝව |
| 15. | 2830/09 | මේස තරාදිය |
| 16. | 97083 | Har Vest Oven ටෝස්ටරය |
| 18. | 97108 | Biaoya Sha Ve Hair Frimmer |
| 19. | 4841 | Mitshn විදුලි ඉස්ත්‍රික්ක එකක් |
| 20. | 97096 | Steam විදුල ඉස්ත්‍රික්ක එකක් |
| 21. | | Scarlelt විදුලි ඉස්ත්‍රික්ක එකක් |
| 22. | 10746 | Bright Eelectric විදුලි ඉස්ත්‍රික්ක එකක් |
| 23. | 10131 | ඩිජිටල් තරාදිය |
| 24. | 43956/06 | විදුලි කේතලය |
| 25. | 97093 | Kadio කැල්කියුලේටරය |
| 26. | 97090 | Chaobowang හෙයාර් බ්‍රෂර් එකක් |
| 27. | 43952/06 | Tiger විදුලි පන්දමක් |
| 28. | 53834 | Koawa කුඩා රේඩියෝව |
| 29. | 11497/09 | Casio කැල්කියුලේටරය |
| 30. | 11582/09 | Checlc Corrent කැල්කියුලේටරය |
| 31. | | Multilac තීන්ත ටින් එක |
| 32. | 1614/09 | කුඩා තරාදිය සහ ඉටිරෝලක්, කතුරු 05ක් |
| 33. | 10129/09 | ඩිජිටල් තරාදිය |
| 34. | 10132/09 | මේස තරාදිය |
| 35. | 9249/09 | Shell ගෑස් සිලින්ඩරය (ගෑස් සහිත) |
| 36. | 2453/09 | වාහන පැති කණ්නාඩි 02ක් සහ සිග්නල් ලයිට් 02ක් |
| 37. | බී/199/03 | වාහන රිම් කප් 06ක් |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 38. | | ඇලුමිනියම් කළගෙඩි 01යි |
| 39. | 10134/09 | Budry මේස තරාදිය |
| 40. | | උතුරු තරාදිය 02ක් |
| 41. | | ඇලුමිනියම් තේ මුට්ටියක් |
| 42. | 82181 | අඩි 02ක් දිග ගැල්වනයිස් බට කෑබලි 09ක් |
| 43. | | පැරණි විදුලි පංකා ගෙඩි 02ක් |
| 44. | 6848/09 | අඟල් 28 Toshiba අඟල් 28 රූපවාහිනිය හා Sony DVD යන්ත්‍රය |
| 45. | 6295 | සෝනි වර්ගයේ අඟල් 34 වර්ණ රූපවාහිනී Sc DVD යන්ත්‍රය |
| 46. | 91174 | සෝනි වර්ගයේ අඟල් 32 රූපවාහිනිය Panasonic DVD යන්ත්‍රය |
| 47. | 1231 | අඟල් 38 සෝනි වර්ගයේ වර්ණ රූපවාහිණිය |
| 48. | 6294 | 1. අඟල් 34 සෝනි වර්ගයේ රූපවාහිනිය<br>2. Pioneer ඇම්ප් එකක්<br>3. L. G. DVD යන්ත්‍ර එකයි |
| 49. | 1231 | සෝනි වර්ගයේ අඟල් 32 වර්ණ රූපවාහිණිය |
| 50. | 1231 | 50 W ඇම්ප් එකක් |
| 51. | 1231 | Samsuny DVD යන්ත්‍රය |
| 52. | 1231 | Akira DVD යන්ත්‍රය |
| 53. | 1231 | Elikta DVD යන්ත්‍රය |
| 54. | 6705 | Sony DVD යන්ත්‍රය |
| 55. | නඩු අංකය සඳහන්ව නැත | Anova DVD යන්ත්‍රය |
| 56. | 12313 | Casio කැල්කියුලේටර් 01 |
| 57. | 2192/09 | Citizen කැල්කියුලේටර් 01 |
| 58. | 6412/09 | Computer එකක් |
| 59. | 10135 | මේස තරාදිය |
| 60. | 6705/09 | අඟල් 28 NEC වර්ගයේ වර්ණ රූපවාහිනිය |
| 61. | නඩු අංකය නැත | Toshiba VCD යන්ත්‍රය |
| 62. | නඩු අංකය නැත | Singer අඟල් 24 රූපවාහිනිය |
| 63. | 80790/08 | Samsun වර්ගයේ පරිගණකය |
| 64. | 82331 | AKAI වර්ගයේ DVD යන්ත්‍රය |
| 65. | 86671 | Technikka වර්ගයේ DVD යන්ත්‍රය සහ බූෆර් |
| 66. | නඩු අංකය නැත | LG අඟල් 24 රූපවාහිනිය (අබලන්) |
| 67. | නඩු අංකය නැත | Sony අඟල් 32 අබලන් රූපවාහිනිය |
| 68. | නඩු අංකය නැත | 20 Kg යකඩ පඩි 20ක් |
| 69. | නඩු අංකය නැත | ඉලෙක්ටෝනික් තරාදිය |
| 70. | 91129 | ඉලෙක්ටෝනික් තරාදිය |
| 71. | 368/සී | නිසාන් FB 15 කාර් රථයක පිටුපස බොනට් 03 සිග්නල් ලයිට් 02යි පැතිකණ්නාඩි 06යි<br>Hiace ඩොලිෆින් රථයක බෆර් දෙකක් |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 73. | | රැලේ වර්ගයේ අබලන් පාපැදිය |
| 74. | | රැලේ වර්ගයේ පාපැදිය |
| 75. | 20309 | යමහා වර්ගයේ මෝටර් සයිකලය ඇන්ජිම සහ වැසිය |
| 76. | AR 709 | මෝපැඩ් බයිසිකලය (අබලන්) |
| | | මෝටර්සයිකලයක ෂොකැබ්සෝබර් 02 පිටුපස වැසියේ කොටසක් සහ තවත් ෂොක්ඇබ්සෝබර් 2 |
| 78. | නඩු අංකය නැත | වෑන් රථ වින්ඩ්ස්ක්‍රීන් එකක් |
| 79. | නඩු අංකය නැත | 250 Kg බිම් තරාදිය |
| 80. | නඩු අංකය නැත | විශාල ප්‍රමාණයේ ඔක්සිජන් ගෑස් සිලින්ඩරය |
| 81. | නඩු අංකය නැත | වාහන ගියර් පෙට්ටි එකක් |
| 82. | නඩු අංකය නැත | වාහන ගියර් පෙට්ටි එකක් |
| 83. | නඩු අංකය නැත | මෝටර් බයිසිකල් හැඩල් වර්ග (විවිධ) සහ අමතර උපාංග |
| 84. | නඩු අංකය නැත | ලෝඩ් වයර් තොගයක් |
| 85. | නඩු අංකය නැත | මෝටර් බයිසිකල් සයිලන්සර් 04ක් |
| 86. | | වාහන දුනු කොළ දෙකක් |
| 87. | | තඹ කම්බි රෝලක් |
| 88. | | විවිධ වාහන අමතර කොටස් තොගයක් |
| 89. | බී/509/2000 | ඇලුමිනියම් තහඩු තොගයක් |
| 90. | | රබර් ජල බටයක් (හෝස් එකක්) |
| 91. | | මෝටර් බයිසිකල් අමතර කොටස් තොගයක් (පැට්‍රල් ටැංකි, රිම් කීපයක්) |
| 92. | 77953 | අඟල් 32 අකිරා වර්ගයේ රූපවාහිණිය |
| 93. | 1231 | අඟල් 36 Sony වර්ගයේ රූපවාහිනිය |
| 94. | | අඟල් 12 පැනසොනික් රූපවාහිනිය |
| 95. | | අඟල් 12 ටෙලිසොනික් වර්ණ රූපවාහිණිය |
| 96. | 9748/සී | ටෝස්ටරයක් |
| 97. | බී/213/සී | විදුලි මෝටරයක් |
| 98. | 561/සී | සෝනි අඟල් 14 වර්ණ රූපවාහිනිය |
| 99. | නඩු අංක සඳහන්ව නැත | සෝනි අඟල් 24 වර්ණ රූපවාහිනිය |
| 100. | නඩු අංක සඳහන්ව නැති | අඟල් 24 වර්ණ රූපවාහිණිය |
| 101. | නඩු අංක සඳහන්ව නැති | Philips අඟල් 12 වර්ණ රූපවාහිනිය |
| 102. | නඩු අංක සඳහන්ව නැත | Sony අඟල් 24 වර්ණ රූපාහිනිය |
| 103. | නඩු අංක සඳහන්ව නැත | ගෑස් සිලින්ඩරය (ගෑස් රහිතව) |
| 104. | 53803 | ඩිජිටල් තරාදිය |
| 105. | නඩු අංක සඳහන්ව නැත | Photoviewer DVD යන්ත්‍ර 01යි |
| 106 | | Sumsuny DVD යන්ත්‍ර 01යි |
| 107. | 26112 | AKIAR DVD යන්ත්‍ර 01 |

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගම්පහ**

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය භාරයට පත් රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2009.11.21 වැනි දින පෙ. ව. 9.45 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත්කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබා ගෙන පෙ. ව. 8.30 සිට 9.30 දක්වා වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැක.

04. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ම ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු ය.

05. වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් හා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන්ට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු ලැබේ.

06. අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසි සඳහා ඉදිරිපත් කළ භාණ්ඩ ඉවත් කර ගැනීම හා අවලංගු කිරීම අධිකරණය සතුය.

එච්. එම්. ආර්. අනුර කුමාර,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු
ගම්පහ.

2009 ඔක්තෝබර් මස 05 වැනි දින,
ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ විස්තරය**

***ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය***

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | ඒආර් 378/9 | චැසි අංක ජීඑන් 80-100761 එන්ජින් අංක ජීඑන් 80-100602 හා ලියාපදිංචි අංක 127-9485 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය |
| 02. | ඒආර් 2186/9 | චැසි අංක එෆ්ආර් 50-71189 එන්ජින් අංක එෆ්ආර් 50-647086 හා ලියාපදිංචි අංක 138-8036 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය |
| 03. | 71736/3/ඊ | චැසි අංක වී 80-1143359 එන්ජින් අංක වී 80-1143359 හා ලියාපදිංචි අංක 111-0395 දරන යමහා වර්ගයේ යතුරුපැදිය |
| 04. | ඒආර් 1895/8 | චැසි අංක වී 80-4008682 එන්ජින් අංක වී 80-4008682 හා ලියාපදිංචි අංක 127-0308 දරන යතුරුපැදිය. |
| 05. | 21528/පීසී | චැසි අංක එන්එෆ් 41 බී 553132 එන්ජින් අංක එෆ් 406-564164 හා ලියාපදිංචි අංක 138-6416 දරන යතුරුපැදිය. |
| 06. | ඒආර් 2793/8 | චැසි අංක Apriliaetx 50-03408 එන්ජින් අංක නොමැති NWGA 5496 දරන Aprilia වර්ගයේ යතුරුපැදිය. |
| 07. | ඒ. ආර් 2069/8 | චැසි අංක කේ. 125-394374 හා එන්ජින් අංක කේ. 125-396877 හා ලියාපදිංචි අංක 127-2233 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය. |
| 08. | ඒ. ආර්. 3696/8 | චැසි අංක සීඩී 50-1305904 හා එන්ජින් අංක සී ඩී 50 ඊ 1326104 ලියාපදිංචි අංක නොමැති හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය. |
| 09. | ඒආර් 1894/8 | චැසි අංක V 80-5432494 එන්ජින් අංක V 80-5432494 හා ලියාපදිංචි අංක 143-6207 දරන යමහා වර්ගයේ යතුරුපැදිය. |
| 10. | ඒආර් 2792/8 | චැසි අංක ඒඩී 01-1000342 එන්ජින් අංක ADOIE - 1000237 හා ලියාපදිංචි අංක 116-4796 දරන හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 11. | ඒආර් 224/8 | චැසි අංක ඒඩී 06-1100826 එන්ජින් අංක ඒ 006-1100953 හා ලියාපදිංචි අංක නොමැති හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 12. | ඒ. ආර්. 2225/8 | චැසි අංක එෆ්එම් 50-13956 එන්ජින් අංක එෆ්එම් 50-13679 හා ලියාපදිංචි අංක නොමැති සුසුකි වර්ගයේ යතුරුපැදිය |
| 13. | ඒ.ආර් 1893/8 | චැසි අංක සීඑෆ් 50-2565241 එන්ජින් අංක සීඑෆ් 50ඊ 2565311 හා ලියාපදිංචි අංක 105-3093 දරන යතුරුපැදිය |
| 14. | ඒ. ආර්. 1892/8 | චැසි අංක ඒඩී 01-1004734 එන්ජින් අංක ඒඩී 01 ඊ 1004243 හා ලියාපදිංචි අංක 116-8491 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 15. | ඒ. ආර්. 377/9 | චැසි අංක 3එෆ් වයි 007423 එන්ජින් අංක 3 එෆ්වයි - 007423 හා ලියාපදිංචි අංක ඩබ්. පී. ජී. බී. 2712 දරන යමහා වර්ගයේ යතුරුපැදිය |
| 16. | ඒ. ආර්. 1525/8 | චැසි අංක සීඩී 50-1500656 එන්ජින් අංක සී. ඩී. 50 ඊ 1500001 හා ලියාපදිංචි අංක නොමැති හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය. |
| 17. | බී 684/3 | චැසි අංක එල්එච් 110-0002908 එන්ජින් අංක Localy std හා ලියාපදිංචි අංක නොමැති වෑන් රථය කොටස් සඳහා |
| 18. | 83429/පීසී | එන්ජින් අංක 4 ඩී 32-850998 හා ලියාපදිංචි අංක නොමැති මිට්සුබිසි කැන්ටර් රථය කොටස් සඳහා |
| 19. | 63364/ඊ/5 | චැසි අංක, එන්ජින් අංක නොමැති ලියාපදිංචි අංක 11 ශ්‍රී 3886 දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය කොටස් සඳහා |
| 20. | බී 2523/8 | චැසි අංක 24 FBHD 44461 එන්ජින් අංක ARMBHD 22770 හා ලියාපදිංචි අංක WPGJ 8598 දරන බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය |

11-01

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බටලන්ද හෙයියන්තුඩුව අංක 93/16බී දරන ස්ථානයෙහි පදිංචි ජයසුන්දර මුදලිගේ සරත් චන්ද්‍රසිරි යන අයව මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරනු ලැබූ නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අර්නස්ට් මැස්සීමස් රත්න එගොඩවත්ත විසින් වර්ෂ 1997 ක් වූ පෙබරවාරි මස දෙවැනි දින සහතික කළ අංක 1964 දරන විශේෂ ඇටෝර්නි බපලත්‍රය අද දින පටන් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කළ බවත් එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය ශුන්‍ය හා බල රහිත හා නීතිය ඉදිරියේ බලාත්මක කළ නොහැකි ලේඛනයක් බවත් රාගම හොරපේ තුඩුවේගෙදර අංක 565 දරන ස්ථානයේ පදිංචි ජයසුන්දර මුදලිගේ සමදරා ජයන්ති (ජා. හැ. අ. 567971333 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ජයසුන්දර මුදලිගේ සමදරා ජයන්ති.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දී ය.

11-30

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ ඇඹිලිපිටිය නවනගරය වැව්අතුර පාර අංක 172 දරන ස්ථානයේ පදිංචි විනීතා රූබසිංහ වන මම ඇඹිලිපිටිය ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ ඒ. ඩබ්ලිව්. අමරතුංග මහතා විසින් වර්ෂ 2007.07.02 දින ලියා සහතික කරන ලද අංක 554 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න, කැල්ල මැදගොඩවත්ත දරන ලිපිනයේ පදිංචි කුමාරසිරි රූබසිංහ නමැති අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත් සියලු මහජනතාවත් අන්සියලු දෙනාවත් මෙයින් දැනගනිත්වා.

එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරුනු ලබන ක්‍රියාවන් හෝ පියවරවල් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව ද සියළු දෙනාම මෙයින් දැන ගනිත්වා.

11-16

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දැනට හම්බන්තොට බැරැක් වීදියේ අංක 13 හි පදිංචි (පෙර රද්දොළුගම ජාතික නිවාස සංකීර්ණයේ 4 බී/08 ආර් හි පදිංචි) තුවාන් මොහමඩ් නසාර් කරීම් වන මම, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් රත්නා ප්‍රනාන්දු චන්ද්‍රසිරි 2004.05.29 දින සහතික කළ අංක 3138 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් රද්දොළුගම 4 බී/8ආර් හි පදිංචි සිත්ති ෆරීෂා අහමඩ්ට (707571993 X ) ලබාදුන් ඇටෝර්නි බලතල අවලංගු කළ බව මෙයින් සියලු දෙනාටම දන්වා සිටිමි.

තුවාන් මොහමඩ් නසාර් කරීම්.

11-126

---

## දැන්වීමයි

2007 අංක 07 සමාගම් පනතේ 9(1) උපවගන්තිය යටතේ මහජනතාව වෙත කරන දැන්වීමයි.

සමාගමේ නම : ඉනර්ග්ලෝබ් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී.වී. 69298
ලියාපදිංචි කළ දිනය : 2009.09.24
ලියාපදිංචි කළ කාර්යාලය : 595A, ඇරැව්වල, පන්නිපිටිය
අධ්‍යක්ෂක -: ඉනර්ග්ලෝබ් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

11-13

---

## නිවේදනයයි

2007 වසරේ අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ වන විධිවිධාන පරිදි පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කෙරේ :

සමාගමේ නම : Ennid Investment Management සීමාසහිත ඉනිඩ් ඉන්වෙස්ට්මන්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV69407
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 43/93, පූර්වාරාම මාවත, කොළඹ 05
ලියාපදිංචි කළ දිනය : 2009 ඔක්තෝබර් 1 දා

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්, (පුද්ගලික) සමාගම.

11-28

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ටර්ගෝ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි සමාගමේ අංකය හා දිනය : පී.වී. 68767, 2009.08.12
ලියාපදිංචි ලිපිනය : නො. 73, එයාර් අරාබියා බිල්ඩින්, සර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
දු. අංක :2689618

2009 ඔක්තෝබර් මස 09 වැනි දින දීය.

11-09/2

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ජ්රම් කන්සල්ටන්සි (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පීවී 69104, 2009.09.09
ලියාපදිංචි ලිපිනය : නො. 39, කිඹුලාපිටිය පාර, මීගමුව.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙක්‍රටරීස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
දු. අංකය : 2689618

2009 ඔක්තෝබර් මස 01 වැනි දින දී ය.

11-09/3

---

## ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීමයි

රත්නපුර, බටුගෙදර, ඇහැළේපොල මාවතේ, අංක 15 හි පදිංචිව සිට දැනට ජපානය, නීගතාකේන් හි පදිංචිව සිටින උච්ඩා උම්මු රහීමා වන මම, පානදුර, වේරවත්තේ අංක 25/38 හි පදිංචි, මොහොමඩ් කාන් හමීමා යන අයට ලබා දුන් මාලිකා ධනුසේකර ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ අංක 1446 දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරමි. මින් ඉදිරියට එය වලංගු නැත.

උච්ඩා උම්මු රහීමා,
අංක 15, ඇහැලේපොළ මාවත,
බටුගෙදර, රත්නපුර.

11-99

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත -පුත්තලම් පාර, ජයබිම ලිපිනයෙහි පදිංචි කුරුකුලසූරිය පාලපට්ටම් කට්ටිගේ ක්‍රිස්ටන් කොන්ස්ටන් ප්‍රනාන්දු වන මම, ඉහත කී ලිපිනයෙහි ම, පදිංචි කාරියවසම් දොන් පත්මලාල් අතුකෝරළ මහතාට, එම්. ඒ. එස්. මැදගොඩ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින්. සහතික කළ අංක 8530 සහ 2008 ක් වූ මැයි මස 06 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින්, මා විසින් දී තිබූ, සියලු බලයත්, ඇටෝර්නි බලපත්‍රයත්, අද දින වන වර්ෂ 2009.09.08 දින මා විසින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මින්පසු, ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත කී කාරියවසම් දොන් පත්මලාල් අතුකෝරළ මහතා විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මා වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශ කරමි.

කුරුකුලසූරිය පාලපට්ටම් කට්ටිගේ
ක්‍රිස්ටීන් කොන්ස්ටන් ප්‍රනාන්දු.

2009 සැප්තැම්බර් මස 08 වැනි දි.

11-08

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ෆැෂන් කොරිඩෝර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2009 ජූලි මස 15 වැනි දින සංස්ථාගත කල බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ෆැෂන් කොරිඩෝර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 68448
ලියාපදිංචි කළ කාර්යාලය : 20/1, 4 වෙනි පටුමග, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ.

එස්. ඒ. එස්. එස්. පී. කුරුකුලසූරිය,
අධ්‍යක්ෂක,

ෆැෂන් කොරිඩෝර් (ප්‍රයිවට්) ලිමිටඩ්.

11-96

---

## ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීමයි

වාද්දුව, තල්පිටිය, දළදාවත්ත පටුමග, නො. 17/ඒ හි පදිංචි වාද්දුවගේ අශාන් ඉන්දුක රත්නායක වන මා (ජා. හැ. අ. 650590554v) වාද්දුව, තල්පිටිය, දළදාවත්ත පටුමග, නො. 17 හි පදිංචි වාද්දුවගේ ලියංකා දීපාල් රත්නායක යන අය මාගේ ඇටෝරනි බලකරු වශයෙන් පත් කරමින්, එල්. එම්. පී. විජේසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන වර්ෂ 1994 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින සහතික කළ අංක 2501 දරන ඇටෝර්නි බලපත්‍රයේ මා විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරනු ලබන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ මින් ඉදිරියට මා වෙනුවෙන් ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

වාද්දුවගේ අශාන් ඉන්දුක රත්නායක.

නො. 17/ඒ,
දළදාවත්ත,පටුමග, තල්පිටිය,
වාද්දුව.

11-98

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : පෙරෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි සමාගමේ අංකය හා දිනය : පී.වී. 69513, 2009.10.09
ලියාපදිංචි ලිපිනය : අංක 33, ලිලි ඇවනිව්, කොළඹ 06.

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
දුරකථන අංක :2689618.

2009 ඔක්තෝබර් මස 13 වැනි දින දීය.

11-09/1

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කඩවත, නුවර පාර, 9 කණුව මහබෝධි මාවත, අංක 131/1 හි පදිංචි ඉවෝන් චාමි ගෝමිස් අබේසිංහ ජයවර්ධන වන මා විසින් එන්. ඩී. වීරසේකර නොතාරිස් තැන විසින් 2009.02.18 දින සහතික කළ අංක 363 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් වත්තල, හැඳල, හැඳල පාර, අංක 323 හි පදිංචි ජයසේකර විතාරනගේ ඉන්දික සම්පත් යන අයට දෙන ලද ඇටර්නි බලකරය 2009.10.19 දින සිට අවලංගු කරන ලද අතර, මෙම දැන්වීම පළ වූ දින සිට ඉහත කී ඇටර්නි බලපත්‍රයෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධව මා මින් ඉදිරියට වගකීමක් නොගන්නා බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ඉවෝන් අබේසිංහ ජයවර්ධන.

2009 ඔක්තෝබර් මස 19 වැනි දින.

11-177

---

### සමාගම් ලියාපදිංචි කිරීම හා නාමය වෙනස් කිරීම පිළිබඳ සාමාන්‍ය දැන්වීම

පහත විස්තර කර ඇති පරිදි 2007, අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ, අනු ඡේද 01 සහ 02 අනුව පහත සඳහන් අංක 1 සිට 2 දක්වා සමාගම් නීත්‍යානුකූලව සමාගමක් ලෙස ලියාපදිංචි කළ අතර අංක 3 වැනි සමාගම එහි නාමය වෙනස් කර නැවත නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ බව දන්වා සිටිමි.

| | *සමාගම් නාමය* | *සමාගම් අංකය හා දිනය* | *ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය* |
|---|---|---|---|
| 1. | අයි. ඩී. එම්. කැම්පස් නෙට්වර්ක් රත්මලාන පෞද්ගලික සමාගම | පී වී 69086 2009 සැප්තැම්බර් මස 08 | අංක 23, ඩේසි විලා මාවත, බම්බලපිටිය කොළඹ 04 |
| 2. | අයි. ඩී. එම්. ග්ලෝබල් පෞද්ගලික සමාගම | පී වී 69528 2009 ඔක්තෝබර් මස 12 | අංක 23, ඩේසි විලා මාවත, බම්බලපිටිය කොළඹ 04 |

3. නව සමාගම් නාමය : ඩී ආර්. ඉන්ඩස්ට්‍රීස් පෞද්ගලික සමාගම
   කලින් ව්‍යවහාර වූ නාමය : ඩී. ආර්. මාර්කටිං කම්පැනි පෞද්ගලික සමාගම
   සමාගම් අංකය හා දිනය : පී වී 8645, 2009 සැප්තැම්බර් 12
   ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 361, නුවර පාර, නිට්ටඹුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි සමාගම් ලේකම්වරු,

මැන්සෙක් සර්විසස් පෞද්ගලික සමාගම, පීබී 6, අංක 6ඒ, 6සී,
ඩේසිවිලා මාවත, බම්බලපිටිය, කොළඹ 04,
දුරකථන අංක : 2597910/1

11-06

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, හැඳල (මුදලි මාවත) සුළු නගර සභා සීමාව ඇතුළත හේකිත්ත තුළ මුදලි මාවත යනුවෙන් හැඳින්වෙන වරිපනම් අංක 66/21, දරන හැඩවකගහකුරුඳුවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බින්දුවයි පර්චස් දහනමයයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 19.25) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ ගොඩනැගිලි ආදී සියලුම දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.11.21 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2007.10.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2007.10.12 වැනි දින රජයේ පුවත්පත් වල පළ වී ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- පැලියගොඩ සිට මීගමුව පාරේ කි. මී. 2.6ක් පමණ ගිය විට වත්තල නගරය හමුවේ. එතැනින් වම් පසට ඇති හේකිත්ත පාරේ. කි. මී. 1.6ක් පමණ ගිය විට ඇල කන්ද පාර හමුවේ.

එහිදී දකුණු පසට මීටර් 700ක් පමණ ජාඇල දෙසට යාමේ දී නැවත දකුණු පසට මුදලි මාවත හමුවේ. එම මුදලි මාවත ඔස්සේ මීටර් 100ක් පමණ ගිය විට පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, අංක 11, ආදිපාද වීදියේ මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය. හිමිකම් ඔප්පු සහ වෙනත් ආදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 2393678, 2387068, ෆැක්ස් අංකය : 2435977.

ඉහත සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළ නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, මුළු
දිවයිනටම සාමදාන විනිශ්චයකාර.

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක : 011-2419126.

11-178

---

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පෙ පත්තුවේ අඳුගොඩ පිහිටි ඇත්අඩිහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රශ්මි විසින් මැන සාදන ලද අංක 287 හා 1992.12.31 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 02 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය, අංක 287 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයේ අක්කර 01, රූඩ් 2, පර්චස් 06 අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් හයයි (එහි තුල ඇති සියලු දේ සමග වේ.) තෙල් මාදුව ආරච්චිගේ වසන්ත චන්ද්‍රසිරි විසින් ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුවට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ආර්. තිස්කුමාර විසින් ලියා සහතික කරන ලද අංක 1547 සහ 2007 ජූනි මස 27 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ ඩී.එෆ්.සී.සී වර්ධන බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 23 වැනි දින ප.ව.2.00 ආරම්භ කර එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීමේ ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැනුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු රු. 2000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500
6. සියලු ප්‍රචාරක වියදම්
7. ගැනුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද, තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් කළ දින සිට දින 30ක් ඇතුලත දී ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා නීති නිලධාරි අමතන්න.

දුරකථන අංක : 011-2442442

ගාමිණී බී. එස්. දීයාව,
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු,

274, ප්‍රීතිපුර පාර, පල්ලිය වත්ත,
හැඳල, වත්තල.
දුරකථන අංක : 077-7281723, 081-4992111

11-101

---

## ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ අගනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අඳුගොඩ පිහිටි ඇත්අඩිහේන වත්ත නමැති ඉඩමේ ලොට් අංක 02 ලෙස බෙදා වෙන් කළ බිම් කට්ටිය, ප්‍රමාණය (අක්කර 01, රූඩ් 02, පර්චස් 06) අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් හයයි (එහි තුළ පිහිටි ගොඩනැගිල්ල වැව්ලි සහ වෙනත් දේ සමග වේ.)

මෑතකදී සිදු කළ මැනුම් පිඹුරක් අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන ආකාරයට විස්තර කර ඇත.

---

## නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ වෙන්දේසි කිරීමයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහ කෝරලේ, දොරතියාව පිහිටි කරඹ එස්ටේට් නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. තිලකරත්න බණ්ඩා විසින් සාදන ලද 2002.02.14 දින සහ අංක 2002/44 දරන පිඹුරේ කැබලි අංක 29 සහ 30 වශයෙන් බෙදා වෙන් කළ සහ නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් පර්චස්

විසි දෙකයි දශම දෙකක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 22.2) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොල පළතුරු සහ සෑම සියලු දේද එකී පිඹුරේ පෙන්නුම්කර ඇති මාර්ග අයිතිය ද සමග කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සෝමවර්ධන ඉහලගම විසින් ලියා සහතික කළ අංක 11267 සහ 2006.02.17 වැනි දින දරන උකස් බැඳුම්කරය මත මාවනැල්ල, කෙරමිණිය, හෙම්මාතගම පාරේ අංක 291/10 දරන ස්ථානයේ පදිංචි පියසේන මුදියන්සේලාගේ රම්‍යාකාන්ති මදනායක යන අය විසින් ඉහත කී බැංකුවට උකස් කරන ලදී.

ඉහත කී පියසේන මුදියන්සේලාගේ රම්‍යාකාන්ති මදනායක යන අය විසින් එකී උකස් බැඳුම්කරය මත ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ඉහත සඳහන් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින පෙ.ව. 11.30ට ආරම්භව දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2008.05.30 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2008.04.30 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිණකුරල් පුවත්පත් ද බලන්න.

සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10% (ගැනුම් මිලෙන් ඉතිරි 90% ගැනුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.)
2. ගැනුම් මිලෙන් 1%ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුවේ.
3. ගැණුම් මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතුය.
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 500
6. නොතාරිස් ගාස්තු රු. 2,500 යි.

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවතේ, අංක 256 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේදී පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන : 011-4682403, 0773918733

එන්. ඩී. පී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්,
155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල.
දු. ක. 011-2731317

11-161

---

**පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ මොරටුව මහා නගර සභා සීමාව තුළ මොරටුමුල්ල 5 වැනි පටුමගේ පිහිටා ඇති මිස්සෙගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. පී. මෙන්ඩිස් විසින් මැන සාදන ලද අංක 921බී සහ 1990.08.04 දිනැති සැලැස්මේ බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම (අක්කර 0, රූඩ් 0, පර්චස් 9.20)

මහමරක්කල පටබැඳිගේ සරත් සිසිල් පෙරේරා විසින් දෙකම පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3573 සහ 2007 අගොස්තු 24 සහ අංක 3602 සහ 2008 අප්‍රේල් 21 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.10.30 රජයේ *ගැසට් පත්‍රය* ද, 2009.10.29 දින ඩේයිලි නිවුස්, ලක්බිම සහ සුඩර් ඔළි පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* :- රාවතාවත්ත හන්දියේ සිට ද සොයිසා පාර දිගේ කිලෝමීටර 02ක් පමණ ගොස් (මොරටුමුල්ල හන්දියෙන් මීටර කිහිපයක් පසුකොට) දකුණු පස ද මැල් මාවතට හැරී මීටර 100ක් පමණ ගමන් ගත් විට එම පාරෙහි දකුණු පස නියමිත ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ද (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ ඒ මත වැට් බද්දද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2 ද (සියයට දෙකහමාරක්)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු, නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලුපාර, කොළඹ 03.

දුරකථන : 2565573/2565565

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් - තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 077-7672082 - ෆැක්ස් 2871184

11-172

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය :- 19/58357/ඉසෙඩ්19/445

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.09.13 *ගැසට් පත්‍රයේ* සහ 2003.03.17 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවතේ, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.12.07 වෙනි දින පස්වරු 1.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ උල්හිටියාව පිහිටි තල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. එම්. ආර්. යාපා විසින් සැකසුණු 1997.06.16 දින හා අංක 5548 දරන පිඹුරේ කැබලි අංක 1 සහ 3 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 16.3 (වඩාත් නිවැරදි අක්කර 0, රූඩ් 0, පර්චස් 30.2 සහ අක්කර 0, රූඩ් 0, පර්චස් 16.3) බෙදා වෙන් කරන ලද බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලු දේත් සමග සහ එකී අංක 5548 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති බිම් කොටස මතින් ඇති මාර්ග අයිතියද සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 55/87 යටතේ ලියාපදිංචි කොට ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-176/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරණු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය :- 4/73107/වයි 4/090

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.09.16 *ගැසට් පත්‍රයේ* සහ 2006.07.03 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කටුගස්තොට, කහල්ල අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.12.04 වෙනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය සභා සීමාව තුළ බූටාවත්ත පිහිටි ඉලුක්පැලැස්සේ හේන දැන් වත්ත වඩාත් නිවැරදි ඉලුක්පැලැස්සේ හේන දැන් වත්ත සහ පාවට්ට පදුරේ හේන දැන් වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. එච්. ටී. ද සිල්වා විසින් සැකසුණු 2001.10.23 දින හා අංක 1047 දරන මිනුම් පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 1, පර්චස් 12 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී. 396/84,85 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද අංක 1047 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 2 මතින් ඇති මාර්ගය ද අයිතීන් ද මේ සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03.
2009 ඔක්තෝබර් මස 23 වැනි දින.

11-176/3

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරණු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංකය :- ජීපී/02/02232/කේ2/890

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.06.23 *ගැසට් පත්‍රයේ* සහ 2009.09.14 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවතේ, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.12.07 වෙනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය පිහිටි මකුල්ලගහවත්ත සහ ගල්මන්කඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සැකසුණු 2003.11.22 සහ අංක 6534 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 15.5 කින් යුක්ත කැබලි අංක 01 දරන බිම් කොටස සහ ඊට අයත් සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ. 919/210 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද ජී. එල්. බී. නානායක්කාර බලයලත් මානක තැනගේ 1991.12.22 දින සහ අංක 10394 දරන පිඹුරේ කැබලි අංක යූ මතින් දක්වා ඇති අඩි 15 පළල සහ අඩි 20 පළල මාර්ග අයිතීන්ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

ඔක්තෝබර් මස 23 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-176/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ පිළිබඳ දැන්වීම

ගම්පහ ප්‍රසිද්ධ නෙතාරිස් එස්. පී. ජයවර්ධන විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට 1999.11.12 වැනි දින ලියා සහතික කරන ලද අංක 24836 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රංජනී ද අල්විස් විසින් 2002.07.16 ලියා සහතික කරන ලද අංක 470 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් 2004.12.08 ලියා සහතික කරන ලද 1144 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් 2007.05.08 ලියා සහතික කරන ලද 2827 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජවර්ධන ගෙදර චන්ද්‍රපාල යන අය බන්දනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපල වර්ෂ 2009 දෙසැම්බර් මස 04 වැනි දින පෙ.ව. 11.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.25 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.09.24 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ඉහල යාගොඩ පිහිටි මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාවල්හෝ විසින් මැන සාදන ලද 1999.07.25 දිනැති අංක 985 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 4ඒ දරන කොටස ප්‍රමාණය. රූඩ් එකක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 0)

*පිවිසීම* .- කඩවත නගරයේ සිට නුවර පාරේ ඉඹුල්ගොඩ පාසල් හන්දිය දක්වා ගමන් කොට (කි. මී. 2.4ක්) වමට හැරී ඉහල යාගොඩ පාරේ කි. මී. 2.8 ගමන් කිරීමේදී හමුවන ලුම්බිනි කණිෂ්ඨ විද්‍යාලය අසල දකුණු පැත්තේ ප්‍රධාන පාරට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, නො. 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 දුරකථන අංක 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථනය 071-4175944

11-196

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී දෙල්ගොඩ ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ පිළිබඳ දැන්වීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2008.04.22 දින සහ අංක 25841 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම

හලාවතගේ ගුණවර්ධන පෙරේරා සහ කුරණගේ ලුසිඩා මියුරි පෙරේරා (ගයනි ඩිස්ට්‍රිබියුටර්ස් හි හවුල්කරුවන් වන) යන අය බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින ප.ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ නැගෙනහිර වැලිවේරියෙහි පිහිටි දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. එච්. එම්. බී. පෙරේරා විසින් සකස් කරන ලද අංක 2005.07.20 දින සහ අංක 1313බී දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටස. ප්‍රමාණය පර්චස් විසි දෙකක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 22)

*පිවිසීම*.- දෙල්ගොඩ නගරයේ සිට නව නුවර පාර දෙසට කි. මී. 6ක් පමණ බැළුම්මහර දෙසට ගමන් කොට වැලිවේරිය පොලිසිය දක්වා ගමන් කොට වමට හැරී යන අඩි 12 පමණ පළල බොරලු සහිත පාරේ අවසානයේ නැවත පොදු ළිඳ ට යාබද වමට හැරී මීටර් 100 පමණ ගමන් කිරීමේදී එම මාර්ගයේ දකුණට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.18 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.09.16 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් )(10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, නො. 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථනය 071-4175944

11-194

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී- කහවත්ත ශාඛාව

කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ පිළිබඳ දැන්වීම

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිකරු විසින් වෙන්දේසිය නතර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ද, තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත් කළ දින සිට දින 30 ක් ඇතුළත දී ගෙවිය යුතුයි.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, ජ්‍යෙෂ්ඨ උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක : 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය: 011-2445393.

වැඩි විස්තර සඳහා ඩී.එෆ්.සී.සී. බැංකුවේ දුරකථන අංක : 011-2442442 අමතන්න.

11-106

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ඒ. ඒ. ජී. කේ. අලහේන්ද්‍ර
ගිණුම් අංක : 1033 5005 1345.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009ක් වූ මාර්තු මස 13 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 798 ප්‍රකාර රුපියල් තුන්ලක්ෂ අසූතුන්දහස් අටසිය

පනස් පහයි ශත එකක (රු. 383,855.01) මුදල ද, 2008 නොවැම්බර් මස 27 වැනි දින සිට අංක 798 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල ද පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ පනස් දෙදහස් පන්සිය දෙකයි ශත විසි තුනක (රු. 352,502.23) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.25 දින රජයේ ගැසට් පත්‍රයේ 2009.09.17 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009.12.10 දින පෙ. ව. 10.30 පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්. ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ මැද පත්තුවේ රත්නපුර මහ නගර සභා සීමාවත් තුළ බටුගෙදර ග්‍රාමයෙහි පිහිටි බටුගෙදර ප්‍රධාන පාරේ වරිපනම් අංක 23/1 (පැරණි දරන 'ගලේවත්ත' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. ඒ. තම්බයියා යන අය විසින් සාදන ලද 1976 පෙබරවාරි 14 දාතම හා අංක 3082 දරන පිඹුරේ ලොට් 10 වශයෙන් නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට: ලොට් 21 ඒ, නැගෙනහිරට ලොට් 22 දකුණට ලොට් 9 සහ බස්නාහිරට ලොට් 21 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, වරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද එකී අංක 3082 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව බී 484/267 හි රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-134/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ජේ. පී. ටී. නිල්දිය සහ ඒ. එම්. ඒ. ඩබ්ලිව්. කුමාර
ගිණුම් අංකයන් : 1056 5002 3621 සහ 0056 5000 2301.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අට ලක්ෂ හය දහස් හාරසිය තිස්පහයි ශත අනූහතරක (රු. 806,435.94) මුදල ද, 2007 මාර්තු මස 07 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල ද පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ හැටපන් දහස් අටසිය හතලිස් හයක (රු. 765,846) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009 අප්‍රේල් මස 24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009 අප්‍රේල් මස 23 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009.12.04 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, බටහිර නව උඩුදුම්බර කෝරළේ, ගම්පහ කෝරළේ, උඩුදුම්බර ප්‍රාදේශීය සභා සීමාවත් තුළ මැදිවක ග්‍රාමයේ පිහිටි 'කනහම්පිටියේ හේන' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. පුංචිහේවා යන අය විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 1893 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් ඊසානට එෆ්. වී. පී. 434 හි ලොට් 163 සහ මදුගොඩ මහවෙල ප්‍රධාන පාර, නැගෙනහිරට එෆ්. වී. පී. 434 හි ලොට් 155 වශයෙන් ලකුණුකොට ඇති ඇල, දකුණට : පිඹුරු අංක 1893 හි ලොට් 2 සහ එෆ්. වී. පී. 434 හි ලොට් 149, 154 සහ 13 හි වැට සහ මායිම සහ බස්නාහිරට එෆ්. වී. පී. 434 හි ලොට් 150 හි මායිම සහ ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස් නමයක් (අක්. 1 රූ. 3 පර්. 39) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1893 අනුව වෙළුම/පත්‍රිරුව එම් 64/208 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-134/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ටී. එච්. ඩී. ගුණසේකර
ගිණුම් අංක : 0075 5000 0401.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ අගෝස්තු මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහය ලක්ෂ හැත්තෑ හය දහස් එකසිය තිස් අටයි ශත හතලිස් හතරක (රු. 2,676,138.44) මුදල ද, 2008 මාර්තු මස 18 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල ද පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිහතර ලක්ෂ හතලිස් හය දහස් නමසිය හැත්තෑ හතයි ශත අසූතුනක (රු. 2,446,977.83) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009 ජූලි මස 31 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009 ජූලි මස 20 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009 දෙසැම්බර් මස 03 වැනි දින ප. ව. 3.30ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, වාද්දුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පානදුර උප කාර්යාලයේ) උතුරු තල්පිටිය පිහිටි මැද පටුමග වරිපනම් අංක 19/ඒ දරන ලොට් 2 බී 1 හි දොඹගහවත්ත යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. ආර්. ජයසේකර යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් මස 30 දාතම හා අංක 2672 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් සී වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් ඩී (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම), නැගෙනහිරට : පිඹුරු අංක 2672 හි ලොට් බී, දකුණට පිඹුරු අංක 9507 හි ලොට් 2 බී 2 සහ බස්නාහිරට : පිඹුරු අංක 3059 හි ලොට් 8 දැනට මැද පටුමග සහ පිඹුරු අංක 3059 හි ලොට් 2 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි බිංදුවක් (අක්. 0 රූ. 0 පර්. 12.80) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතින් ද, වරප්‍රසාදයන් ප්‍රවශ්‍යතාවන්, පරවශතාවයන් ද, වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 2672 ට අනුව වෙළුම/පත්‍රිරුව එෆ් 521/205 හි පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-134/4

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ඩබ්ලිව්. පී. එස්. එල්. විතාරන
ගිණුම් අංක : 0025 5002 7022

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ මාර්තු මස 13 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 38284 ප්‍රකාර රුපියල් නමලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑ අටයි ශත හතලිස් හයක (රු. 930,678.46) මුදලක් 2009 ජනවාරි මස 06 වැනි දින සිට අංක 38284 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අට ලක්ෂ පහළොස් දහස් හයසිය අසූතුනයි ශත හැට තුනක (රු. 815,683.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.03 දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.08.25 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2009.11.27 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර උඩුගොඩ උඩසිය පත්තුවේ, කොහොලන්වෙල පිහිටි ඇල්හේන කනත්ත කැටකලගහමුල්ලහේන යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2004 ජනවාරි මස 26 දාතම හා අංක 4685 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් ඊසානට දඹුල්ල සිට මාතලේ දක්වා දිවෙන මාර්ගය, ගිණිකොණට නන්ද සිල්වා යන අය විසින් වර්තමානයේ හිමිකම් කියන දම්මන්හේන වෙන්කරන කම්බි සහ පැළඉනි වැට, නිරිතට බර්නි වීරසිංහ යන අය විසින් වර්තමානයේ හිමිකම් කියන ඇල්හේන කනත්ත වෙන්කරන කම්බි සහ පැළඉනි වැට සහ වයඹට: අංක 4685 පිඹුරේ ලොට් 1 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දහ තුනක් (රූ. 3 පර්. 13) විශාල ඉඩම් කොටස සමග වගාවන්. සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, වෙළුම/පත්‍රිරුව ඩී 477/214 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-135/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

සින්කා සීඩින්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0006 1000 8003

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල

ප්‍රකාර 2008 ක් වූ ජුලි මස 24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 789 ප්‍රකාර රුපියල් හතළිස් තුන් ලක්ෂ පනස් හය දහස් හයසිය අනූ තුනයි ශත අසූ දෙකක (රු. 43,56,693.82) මුදල ද 2008 මැයි මස 08 වැනි දින සිට අංක 789 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් නව ලක්ෂ පහළොස් දහස් හය සියයක (රු. 39,15,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.14 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009.08.03 වැනි දින 'දිවයින', 'අයිලන්ඩ්' සහ 'තිනකුරල්' දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009.11.30 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තු තිරගන්දාහේ කෝරළේ තෝරවතුර ග්‍රාමයේ පිහිටි 'දංගස්පිටිය එස්ටේට්' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. බී. කලවානේගම යන අය විසින් සාදන ලද 1993 දෙසැම්බර් මස 13 වැනි දින දාතම හා අංක 694/ඩී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : රඹුක්කන සිට කුරුණෑගලට දිවෙන පාර වශයෙන් ලියාපදිංචි කොට ඇති නමුත් කුරුණෑගල සිට රඹුක්කන දක්වා දිවෙන පාර දකුණට : අංක 694/ඊ පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට : රංජිත් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන කුඹුර සහ රංජිත් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන කුඹුර වශයෙන් ලියාපදිංචි කොට ඇති නමුත් පිවිසුම් මාර්ගය සහ නිකලන්ද වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දාහතක් (අ. 1 රූ. 0 පර්. 17) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, එකී පිඹුරු අංක 694/ඩී අනුව වෙළුම/පත්ඉරුව ඒ 1285/273 හි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-136/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ආර්. එම්. එම්. ජී. රත්නායක.
ගිණුම් අංක : 0021 5002 9530 සහ 0021 5003 1209.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 11415, 13393, 11417 සහ 13391 ප්‍රකාර රුපියල් හතළිස් හය ලක්ෂ තිස් පන්දහස් තුන්සිය අනූපහයි ශත අසූවක (රු. 46,35,395.80) මුදල ද, 2008 සැප්තැම්බර් මස 01 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හතර දහස් නමසිය අනූ අටයි ශත තිස්හයක (රු.3,74,998.36) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් අට ලක්ෂ දොළොස් දහස් තුන්සිය පනහක (රු. 8,12,350) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිඑකක් (21%) හා තවත් රුපියල් හාර ලක්ෂයක (රු. 4,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) හා තවත් රුපියල් විසි තුන් ලක්ෂ පනස් හතර දහස් හත්සිය දහතුනයි ශත විසිතුනක (රු. 23,54,713.23) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.21 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009.08.10 දින 'දිවයින', 'අයිලන්ඩ්', සහ 'තිනකුරල්' දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2009.11.30 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා සීමාවන් තුළ කුරුණෑගල හි පිහිටි බෞද්ධාලෝක මාවත වරිපනම් අංක 30, දරන 'වලව්වේවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. කම්මන්කඩ යන අය විසින් සාදන ලද 1996 ජනවාරි 30 දාතම හා අංක 1891 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරටː පිඹුරු අංක 1551 හි ලොට් 08 වශයෙන් ලකුණු කොට ඇති මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : පිඹුරු අංක 1891 හි ලොට් 02 දකුණට : පාර පුළුල් කිරීම සඳහා වෙන් කිරීමක් වන එකී පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : බෞද්ධාලෝක මාවතේ 1 වැනි පටුමග යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම තුනයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 8.30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ඒ 1616/174 හි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද 2006 පෙබරවාරි මස 24 දාතම හා අංක 13391 සහ 2004 පෙබරවාරි මස 17 දාතම හා අංක 11417 යන උකස් බැඳුම්කර දෙක මගින් උකස් කොට ඇපකොට ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළ්, කුරුණෑගල මහ නගර සභා සීමාවන් තුළ කුරුණෑගල හි පිහිටි බෞද්ධාලෝක මාවත වරිපනම් අංක 30, දරන 'වලව්වේවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. කම්මන්කඩ යන අය විසින් සාදන ලද 1996 ජනවාරි මස 30 දාතම හා අංක 1891 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරටː පිඹුරු අංක 1551 හි ලොට් 08 වශයෙන් ලකුණු කොට ඇති මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : පිඹුරු අංක 1891 හි ලොට් 3 සහ පිඹුරු අංක 1551 හි ලොට් 04 දකුණට : පාර පුළුල් කිරීම සඳහා වෙන් කිරීමක් වන එකී පිඹුරේ ලොට් 04, සහ බස්නාහිරට : පිඹුරු අංක 1891 හි ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (අ. 0 රූ. 0 පර්. 7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන් ද,

වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්‍රිරුව ඒ 1616/175 හි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී කුරුණෑගල මහ නගර සභා සීමාවන් තුළ කුරුණෑගල හි පිහිටි බෞද්ධාලෝක මාවත වරිපනම් අංක 30, දරන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. කම්මන්කඩ යන අය විසින් සාදන ලද 2003 මාර්තු 08 දාතම හා අංක 2798 දරන මැතක දී මනින ලද ලොට් 02 වශයෙන් දක්වා ඇති ඉහත ඉඩම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 2519 හි ලොට් X නැගෙනහිරට : පිඹුරු අංක 2519 හි ලොට් X, දකුණට : බෞද්ධාලෝක මාවත සහ බස්නාහිරට : පිඹුරු අංක 1891 හි ලොට් 03 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හත (අ. 0 රූ. 0 පර්. 07) ඉහත කී මිනුමට අනුවය.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වදුරාගල විසින් ලියා සහතික කරන ලද 2006 පෙබරවාරි මස 24 දාතම හා අංක 13393 සහ 2004 පෙබරවාරි මස 17 දාතම හා අංක 11415 යන උකස් බැඳුම්කර දෙක යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-136/2

---

## මහජන බැංකුව - මාතර ධර්මපාල මාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.11.25 වැනි දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :

*උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර :-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ,කන්ද බඩ පත්තුවේ නරවැල්පිට පිහිටි තුසෙව්මිනිහාගෙවත්ත නැමැති ඉඩම 2005.07.16 දිනැති එම්. එල්. එම්. රශ්මි බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2258 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ 'ඒ' අක්ෂරය දරන රූඩ් එකයි පර්චස් අටක් (අක්. 0, රූඩ් 01. පර්. 08) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දෑය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.02.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2008.03.14 වැනි දින දිනමිණ පුවත්පතේ ද පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම .-* හක්මණ ඇල්ලෙවෙල මාර්ගයේ කි. මී. 2 1/2ක් පමණ යන විට නරවැල්පිට හන්දිය හමුවීමට පෙර පාරේ දකුණු පස මෙමෙ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිළෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මාතර, නූපේ, අනගාරික ධර්මපාල මාවතේ අංක 215 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773.
ෆැක්ස් අංකය : 041-2222688.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

හිමිකම් සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. පී. ආනන්ද,
(සාම විනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා
තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංකය : 041- 2228731.

11-182

---

## සෙලාන් බැංකුව පී.එල්.සී. - වව්නියාව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මැදවච්චිය පදිංචි බෝධිය බඳුගේ ප්‍රදීප් රුවන් විජයරත්න යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත කඩවත් කෝරලේ අලුත් කඩවත් තුලාන, මැදවච්චිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ප්‍රියන්ත සමරතුංග විසින් සාදන ලද 2005.11.23 දිනැති අංක 2005/441 දරන සැලැස්මේ ලොට් 1 ලෙස පෙන්නුම් කරනු ලබන මැදවච්චිය කැලේ නමැති (බලයලත් මිනින්දෝරු කේ. කේ. සිල්වා විසින් සාදන ලද 1990.11.27 වැනි දිනැති අංක 242 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 හි නැවත මැනීමක් වන) ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0 රූ. 0 පර්. 8) විශාල ඉඩම. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය, පත්‍රිරුව ඒ 393/67 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ, 2009 දෙසැම්බර් මස 03 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* නුවර - යාපනය ප්‍රධාන මාර්ගයේ පිහිටි මැදවච්චිය වෙළඳ නගරයේ උතුරු කෙළවර හි පිහිටි මැදවච්චිය දිස්ත්‍රික් රෝහලේ දන්ත වෛද්‍යවරයාගේ නිල නිවාසය ඉදිරිපිට යාපනය දෙසට යන විට මාර්ගයේ දකුණු පස අදාල එම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2009.08.28 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, සහ ඩේලිමිරර් පුවත්පත් වල 2009.08.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2009.09.02 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(i) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
(ii) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් (සියයට එකක් ) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්,
(iii) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
(iv) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000,
(v) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
(vi) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරි (නීති) සෙලාන් බැංකුව පී. එල්. සී. අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263,2456284.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011- 2572940.

11-181

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 08 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 25350 දරන උකස්කරය යටතේ උකස්කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ගම්පහ නගර සභා සීමාවට අයත් ගම්පහ, මැදගම ගම්මානයෙහි අංක 81, බෞද්ධාලෝක මාවත පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සී. එල්. ජී. අතුකෝරාළ විසින් සකසන ලද 2007 ජුනි මස 28 වැනි දිනැති පිඹුරුපත් අංක 3141 හි ලොට් අංක එක්ස් 2 ලෙස සඳහන් කහටගහවත්ත ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද ඉඩම.

*ඉඩමේ ප්‍රමාණය* : අක්. 0 රූඩ් 0 පර්. 22 එහි පිහිටි වගාවන්, ගස්, වැල් සහ සියල්ල සහිතව.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2005 සැප්තැම්බර් මස 23 වැනි දිනැති අංක 25350 දරන උකස්කරය ප්‍රකාර ගම්පහ 'ගෑන්ඩ් ප්‍රික්ස් එන්ටර්ප්‍රයිසස් ' නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන ගම්පහ පදිංචි උපුල් වික්‍රමසේකර විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පෙරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 නොවැම්බර් මස 25 වැනි දින (සිකුරාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

(i) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
(ii) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
(iii) වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
(iv) රු. 31,500 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
(v) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
(vi) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත් සියවසකට වැඩි
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

11-76

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.**
(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ උකස් කරන ලද වටිනා දේපළ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේපාල දීගොඩ ගමගේ විසින් ලියා සහතික කරන ලද අංක 5421 සහ 2007 ජනවාරි මස 19 වැනි දිනැති උකස් බැඳුම්කරය මත මහරගම, පමුණුව පාරේ, අංක 72 බී දරන ස්ථානයේ පදිංචි රාජපක්ෂ පේලිගේ දමයන්ති, බ්‍රාහ්මණගේ කිංස්ලි නිශාන්ත පෙරේරා සහ පාඩිගමගේ පියසීලි යන අය විසින් ඉහත කී බැංකුවට උකස්කර ඇති බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ මහරගම නගර සභා සීමාව ඇතුළත පමුණුව ගමේ පිහිටි මහරගම පමුණුව පාරේ වරිපනම් අංක 72 බී දරන මඩතියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1397 සහ 2006 නොවැම්බර් මස 22 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1 දරන පර්චස් දහතුනයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 13.25) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ පළතුරු ගොඩනැගිලි සහ සැම සියලු දේ.

පහත දැක්වෙන ඉඩමෙහි මාර්ග අයිතිය ද සමග වේ :

ඉහත සඳහන් කළ පමුණුව ගමේ පිහිටි මඩතියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 592 සහ 1993 මැයි මස 07 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ඒ2ඊ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන පර්චස් අටයි දශම පහයි නවයක (අ. 0, රූ. 0, පර්. 8.59) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල.

ඉහත කී රාජපක්ෂ පේලිගේ දමයන්ති, බ්‍රාහ්මණගේ කිංස්ලි නිශාන්ත පෙරේරා සහ පාඩිගමගේ පියසීලි යන අය විසින් ඉහත කී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් පැහැර හැර ඇති හෙයින් ඉහත සඳහන් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව වර්ෂ 2009.11.27 වැනි දින පස්වරු 2.30 ට ආරම්භව දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.04.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.26 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයः-

1. ගැණුම් මිලෙන් 10%ක් (ගැණුම් මිලෙන් ඉතිරි 90% සහ ගැණුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය)
2. ගැණුම් මිලෙන් 1ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය,
3. ගැණුම් මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය,
4. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතුය,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 500,
6. නොතාරිස් ගාස්තු රු. 2,500 යි.

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවතේ, අංක 256 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක. දුරකථන අංක : 011-4682403, 077-3918733.

එන්. ඩී. ඩී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්.

අංක 155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල.
දුරකථන අංක : 2730962/2731317.

11-160

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුණු)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ජී. ටී. ජයසිංහ සහ අයි. එල්. ජයසිංහ විවාහයට පෙර නානායක්කාර. ගිණුම් අංක : 1056 5000 7294.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008ක් වූ ජුලි මස 24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිපන් ලක්ෂ හැත්තෑ අට දහස් දෙසිය අසූ එකයි ශත පනස් හතක (රු.25,78,281.57) මුදලද 2008 අප්‍රේල් 30 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් , රුපියල් විසි තුන් ලක්ෂ දහ අට දහස් දෙසිය විසි එකයි ශත පනස් දෙකක (රු.23,18,221.52) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතරක් (14%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරන වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.28 දින *රජයේ ගැසට් පත්‍රයේ*, .2009.08.19 දින දිවයින, අයිලන්ඩ්, සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2009.12.22 දින පෙ.ව. 11.00ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගගවත කෝරළයේ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ තල්වත්ත හි පිහිටි *"අටුගොඩමුදුන නොහොත් අටුගොඩඅමුණ නොහොත් අටුගොඩතැන්නේහේන නොහොත් අලගොල්ලෑව"* යයි කියනු ලබන ඉඩමට බලය ලත් මානක තැන ඩබ්ලිව්. ඒ. පියදාස යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 22 දාතම හා අංක 25.10.2005 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා ගුරු පාර, නැගෙනහිරට : 2005 අගෝස්තු 04 දාතම හා අංක 160 ඒ/ 1/2004 දරන පිඹුරේ ලොට් 1 දකුණට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා දිවෙන අඩි 15 පළල සිමෙන්ති

පාර සහ බස්නාහිරට : පී. ජී. සරත්චන්ද්‍ර යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූඩ් 0, පර්චස් 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක 35/10/2005 දරන එකී පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී තල්වත්ත හි පිහිටි 'අටුගොඩමුදුන *නොහොත්* අටුගොඩ අමුණ *නොහොත්* අටුගොඩතැන්නේහේන *නොහොත්* අලගොල්ලෑව හි කොටසක්' යයි කියනු ලබන ඉඩමට බලය ලත් මානක තැන ඩබ්ලිව්. ඒ. පියදාස යන අයවිසින් සාදන ලද 2005 අගෝස්තු 04 දාතම හා අංක 160ඒ/01/2004 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්නය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට සහ වයඹට : ගුරු පාර, ඊසානට : ලොට් 1, දකුණට සහ නිරිතට : කොන්ක්‍රීට් පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක 160ඒ/01/2004 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඒ 359/217 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-134/3

---

## කොළඹ දිසා අධිකරණයේ දී ය

ශ්‍රී ලංකා සේවිංස් බෑන්ක් ලිමිටඩ්
අංක 110, ඩී. එස්. සේනානායක මාවත,
කොළඹ 08.

..................................*පැමිණිලිකරු.*

නඩු අංකය :
17021/එම්බී.

*එදිරිව*

1. ගුරුගේ රංජිත් ප්‍රනාන්දු,
   366ඒ, මැදගම පාර, අම්පිටිය.

2. පලවින්නගේ ගැමුණු කුමාරතුංග,
   366ඒ, මැදගම පාර,
   අම්පිටිය.

..................................*විත්තිකරුවෝ.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ නියෝගය අනුව ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගෙන් අයකර ගන්නා ලෙස පැමිණිලිකරුට නියම කරන ලද රුපියල් අටලක්ෂ හතලිස් හත් දහස් තුන්සිය හතලිස් තුනයි ශත අසූ හතක (රු. 8,47,343.87) මුදලක් සහ 2000 මැයි 16 වැනි දින එය සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් වර්ෂයකට 30% බැගින් වන පොලිය අයකරගැනීමට පැමිණිලිකරුට ආඥා කොට ඇත. තවද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම අයකර ගත යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා බැඳී ඇති බවටත් එය ඇස්කිසි කළ හැකි බවටත් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එසේ හෙයින් ඉහත සඳහන් මුදල අයකර ගැනීම සඳහා මෙම නඩුවේ විත්තිකරුවන්ට අයිති පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල සහ එහි සියලු හිමිකම් සහ අයිතිවාසිකම් වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.30ට එකී දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්දහයේ කෝරළයේ, පහත හේවාහැට අම්පිටිය මැදගම පිහිටි බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. නවරත්න විසින් මැන සාදන ලද 1998.01.05 දිනැති අංක 10058 දරන පිඹුර ප්‍රකාරව හෙනහුන්ගොඩ නමැති ඉඩමේ ලොට් 1 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටසට මායිම් : උතුරට කළුදුරයාගේ වත්ත, දැනට ආර්. සී. අප්පුනයිදේ සහ ඒ. ජී. කිරිදුරයන්ගේ ගොඩමුණේ සහ හෙනහුන්ගොඩ ද, නැගෙනහිරට : මැදගම පාර ද, දකුණට : වදුවහේන සහ බස්නාහිරට : කොස්තාපල්ට හිමි හෙනහුන්ගොඩ ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි එකයි දශම පහයි පහක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 21.55) ක් විශාල, එහි තුළ පිහිටි සියලු දේ සහ එකී පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය සමග ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 358/201 හි ලියාපදිංචි කර ඇත.

*දේපල පිහිටි ස්ථානයට ප්‍රවේශ මාර්ගය.-* මෙම දේපල පිහිටා ඇත්තේ මහනුවර සිට අම්පිටිය ප්‍රධාන බස් මාර්ගයේ ගොස් අම්පිටිය නගරයට පිවිසීමට පෙර උඩගම යන ප්‍රදේශයෙන් දකුණට ඇති මැද්දේගම පාර දිගේ මීටර් 400ක් පමණ යාමේදී මෙම පාරට මායිම්ව දකුණු පසින් වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25%ක මුදලක් එවේලේම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු අතර ඉතිරි මුදල වන 75% දින 30 ක් ඇතුළත ඉහත සඳහන් නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය. ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතුය.

තවද ගැණුම්කරු විසින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන ගැනුම් මිලෙන් 2 1/2%, වෙන්දේසිය පැවැත්වීම සඳහා දරන ලද සියලුම වියදම්, තක්සේරු ගාස්තු .5% ගාස්තු සහ පළාත් පාලන ආයතන ගාස්තු ගැණුම් මිලෙන් 1%ක් (දළ වශයෙන් රුපියල් ලක්ෂ 3ක් පමණ) වෙන්දේසිය අවසන් වූ අවස්ථාවේම වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න,
බලයලත් වෙන්දේසිකරු/තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

220/5, ගම්පහ පාර,
යක්කල.
දුරකථනය : 033-2222568 හෝ 071-8208360.

*වැඩි විස්තර සඳහා .-* කොළඹ 08, ඩී. එස්. සේනානායක මාවත, අංක 110 හි පිහිටි ශ්‍රී ලංකා සේවිංස් බෑන්ක් ලිමිටඩ් -නීති අංශය
දුරකථනය : 011-2691721, 011-2691722 විමසන්න.

11-103

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව (-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් ^I" II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

^ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| නොවැම්බර් | 2009.11.06 | සිකුරාදා | 2009.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.13 | සිකුරාදා | 2009.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.20 | සිකුරාදා | 2009.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.27 | සිකුරාදා | 2009.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2009.12.04 | සිකුරාදා | 2009.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.12.11 | සිකුරාදා | 2009.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.12.18 | සිකුරාදා | 2009.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.12.24 | බ්‍රහස්පතින්දා | 2009.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2010** | | | |
| ජනවාරි | 2010.01.01 | සිකුරාදා | 2009.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.01.08 | සිකුරාදා | 2009.12.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.01.15 | සිකුරාදා | 2010.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.01.22 | සිකුරාදා | 2010.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.01.28 | බ්‍රහස්පතින්දා | 2010.01.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.